සමෘද්ධි සංවර්ධන
දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE

මගේ අංකය / எனது இல / My No: DDD/HO/08/PM/07 චක්‍රලේඛ 2018
ඔබේ අංකය / உமது இல / Your No: ..................................
දිනය / திகதி / Date: 2018.03.16

සමෘද්ධි චක්‍ර ලේඛ අංක :- 2018/07(සැලසුම් හා මෙහෙයුම් අංශය)
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>සමෘද්ධි සහනාධාරලාභීන් සවිබල ගැන්වීම - 2018 - කාර්ය සාධනය පදනම් කරගත් සැලසුම්කරණය</u>**

**1. පසුබිම**

සවිබල ගැන්වීම යනු, බලහත්කාරයෙන් සමෘද්ධි සහනාධාරය කපා දැමීම සඳහා ක්‍රියාත්මක කරන වැඩපිළිවෙලක් නොවන බව පළමුව අවධාරණය කරනු කැමැත්තෙමි. මේ සඳහා තොරාගන්නා සමෘද්ධිලාභී පවුල් ඒකාබද්ධව සංවර්ධනය කිරීමට විශේෂ වැඩපිළිවෙලක් සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, අදාල පවුල් සමාජිකයින් හා ප්‍රජා මූල සංවිධාන නියෝජිතයින් එක්ව සකසා ක්‍රියාවට නංවා ඔවුන් සත්‍ය වශයෙන්ම ඉදිරි කාලයේ දී දුගී බවින් මුදා ගැනීම අපගේ, අභිප්‍රාය වේ. දුගී බවින් මිදීමෙන් පසුව ඔවුන්ට කැමතිනම් ස්වේච්ඡාවෙන් තමා සමෘද්ධි ව්‍යාපාරය හරහා ඉහළ ජීවන තත්ත්වයක් අත්පත් කර ගත් බව පිළිගෙන, තවත් දුප්පත් අයෙකුට තම සමෘද්ධි සහනාධාරය ලබා දීම සඳහා ආපසු භාර දෙන්නේ නම් ඔහු ඇගයීමට ලක්කරන වැඩසටහනකි.

**2.හැදින්වීම**

2.1 මානව අයිතිවාසිකම් සුරැකීමට ලොව ඇති ප්‍රධානතම අභියෝගය වනුයේ දුප්පත්කමයි. දුප්පත්කම අන්‍යෝන්‍ය වශයෙන් අන්තර් සබදතාවයක් ඇති සහ ඒකාබද්ධ වූ කරුණු රැසක ප්‍රතිඵලයක් වන අතර, එමගින් දුප්පතුන් සමාජයෙන් කොන් වීම, අසාධාරණයට ලක්වීම, අනාරක්ෂිතභාවය සහ සමාජයෙන් බැහැරවීම සිදුවන්නේය. මෙම පසුබිම තුළ ගෝලීය තිරසර සංවර්ධන ඉලක්කවල මූලික අරමුණ ලෙස දක්වා ඇත්තේ දිළිඳුකම තුරන් කිරීමයි. ශ්‍රී ලංකාව තුළ දිළිඳුකම පිටු දැකීම අරමුණු කර ගත් ප්‍රමුඛතම ආයතනය වනුයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවයි.

2.2 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර

2.2.1 **දැක්ම**

> “ වසර 2030 වන විට දුගී බවින් තොර, සවිබල ගැන්වූ, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකිරිමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම ”.

2.2.2 මෙහෙවර

> " ආන්තිකරණයට පත් ජනතාව සවිබල ගැන්වීම ( ආර්ථික , සාමාජීය, භෞතික, මානසික, තීරණ ගැනීම, නෛතික හා පාරිසරික ) හා ප්‍රාදේශීය විෂමතාවය අවමකිරීම සඳහා කාර්යක්ෂම, සඵලදායි, වේගවත් හා ඵලදායි විසඳුම් ජනහිතකාමී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා දෙපාර්තමේන්තු, ප්‍රජාමූල සංවිධාන හා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ජාලය හා වෘත්තිකයන්, රජය, පෞද්ගලික, ජනතාව සහ දේශපාලන අංශවල මනා දායකත්වය හා දේශීය හා ගෝලීය
>
> ආයතනවල ද සහභාගීත්වයෙන්, දුගී බවෙන් තොර, සමෘද්ධිමත් දේශයක් ගොඩනැංවීම තුළින් ආර්ථික සංවර්ධනයට දායකවීම ".

මේ අනුව සඳහන් කළ හැක්කේ, දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කිරීම උදෙසා අවශ්‍ය විය හැකි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම තුළින්, දුප්පත් ජනතාව සවිබලගැන්වීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේනතුවේ ප්‍රධාන වගකීම වන බවයි.

ඒ අනුව, 2018 වර්ෂයේ සමෘද්ධි සහනාධාරලාභීන් සවිබලගැන්වීමට අදාල න්‍යායාත්මක කරුණු, උපදෙස් හා මග පෙන්වීම් මෙම චක්‍රලේඛය මගින් ලබා දෙනු ඇත.

3. දිළිඳුකම

දිළිඳුකම යන්න සමාජයක, ජීවත්වන එක් ජන කොටසක්, එම සමාජයේම ජීවත්වන අනෙක් ජන කොටස් සමඟ සසඳා බැලීම තුළින්, හඳුනා ගන්නා වාස්තවික තත්ත්වයකි. ලෝක බැංකු නිර්වචනයට අනුව, දිළිඳුකම යනු අර්ථසාධනයේ හිඟ කමයි. එනම්, පුද්ගලයෙකු මනුෂ්‍යයකු හැටියට ජිවත් විමෙ දි තිබිය යුතු මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති නොහැකියාවයි.

දිළිඳුකම එහි ස්වභාවය අනුව කොටස් 02 කට බෙදේ.

1. නිරපේක්ෂ දිළිඳුකම ( Absolute Poverty )
2. සාපේක්ෂ දිළිඳුකම (Relative Poverty)

3.1 නිරපේක්ෂ දිළිඳුකම යනු, ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස හා සෞඛ්‍ය වැනි මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට අවශ්‍ය මාර්ගවල හිඟකම වේ.

3.2 සාපේක්ෂ දිළිඳුකම යනු, සමාජයේ සෙසු කොටස් හා සැසඳීමේ දි පුද්ගල, සමාජ හා ආර්ථිකමය තත්ත්වයන්වල ඌනතාවයයි.

ඒ අනුව, දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින ජනකොටස් ඉන් ඉහළට ඔසවා, ඔවුන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය වැඩසටහන්, ව්‍යාපෘතින් හා ක්‍රියාකාරකම් සිදුකිරිම සමෘද්ධි වැඩසටහනේ මූලික අරමුණ වේ.

**4. සවිබල ගැන්වීම (තෝරාගැනීමට හා ක්‍රියාකිරීමට ඇති නිදහස)**

4.1. සවිබල ගැන්වීම යනු තමාගේ ජන ජිවිතය පාලනය කිරීම හා අයිතිවාසිකම් සඳහා හිමිකම් පෑමට අවකාශ සැලසෙන පරිදි පුද්ගලයින් හා කණ්ඩායම් ශක්තිමත් කිරීමේ හා ඔවුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමේ ක්‍රියාවලිය වේ. ඒ අනුව සවිබල ගැන්වීමට අදාල වන ප්‍රධාන ලක්ෂණයන් වනුයේ,

- ජන ජිවිතය පාලනය කිරීම
- අයිතිවාසිකම් සඳහා හිමිකම් පෑම
- පුද්ගලයින් හා කණ්ඩායම් ශක්තිමත් කිරීම හා විශ්වාසය වර්ධනය කිරීමේ ක්‍රියාවලිය

- තම තමන්ගේ හැකියාවන් පිළිබඳව ධනාත්මකව සිතන්නට පෙළඹීම හා විශ්වාසය ගොඩනැගීම හා අවශ්‍ය වෙනස්කම් තමා විසින්ම සිදුකර ගැනීමට උනන්දු වීම.

**5.සවිබල ගැන්වීමේ ප්‍රධාන ක්ෂේත්‍ර**

5.1. සවිබල ගැන්වීම විවිධ පැතිකඩ වලින් සමන්විත ඒකාබද්ධ ප්‍රවේශයක් වන අතර, ප්‍රධානතම සවිබල ගැන්වීම් ක්ෂේත්‍ර 08 ක් වේ.

1. ආර්ථික ( Economic ) සවිබලගැන්වීම
   තම හැකියාවට හා ශ්‍රමයට නියම වටිනාකමක් ලබා ගැනීම සඳහා යෝග්‍ය මූල්‍ය ශක්තිය හා වත්කම් පදනම වර්ධනය කිරීම
2. සමාජීය හා සංස්කෘතික ( Social and cultural) සවිබලගැන්වීම
   දුප්පතුන්ට දුප්පත්කමින් මිදීමට බාධාකරණ සමාජ සම්බන්ධතා සහ ආයතන, පුද්ගල වශයෙන් හා ඒකාබද්ධව වෙනස් කිරීමට අවශ්‍ය ස්වාධීනබව හා ආත්ම විශ්වාසය ගොඩනැගීම
   පුද්ගලයෙකුගේ සංස්කෘතිය සමාජය තුළ කෙතරම් විශාල හෝ කුඩා වුවද, එය ආරක්ෂා කිරීමට හා විදහා පෑමට ඔහුට ඇති අයිතිය හා නිදහස තහවුරු කිරීම.

3. තීරණ ගැනිමට අදාල (Decision Making ) සවිබලගැන්වීම
   තමාව හා අන් අය නියෝජනය කිරීමට ඇති හැකියාව, තොරතුරු දැනගැනීම හා ලබා ගැනීම හා තීරණ ගැනීමට සක්‍රීයව දායක වීමේ හැකියාව ඇති කිරීම.
4. ශාරීරික ( Physical ) සවිබලගැන්වීම
   ආහාර සුරක්ෂිතතාවය, මනා සෞඛ්‍ය හා ලෙඩ රෝග වලින් ආරක්ෂා වීම සහ පෝෂණය
5. මානසික( Psychological ) සවිබලගැන්වීම
   යැපුම් මානසිකත්වයෙන් මිදී, " YES WE CAN - ඔව් මට/අපට පුළුවන්" යන ආකල්පයෙන් සන්නද්ධවීම, ධනාත්මකව සිතීම, සැම දෙය දෛවයට හා කර්මයට භාර නොදී සිටීම. එමෙන් ම, තම ආයතනයේ ඉලක්ක හා පරමාර්ථ මනාව තේරුම් ගැනීම හා උකහා ගැනීම.

6. පාරිසරික ( Environmental ) සවිබලගැන්වීම
   පරිසර හානිය හා සම්පත් නාස්තිය අවම කිරීම (Reduce, Reuse, Recycle And Renewable - අවම කිරීම, නැවත පාවිච්චිය, ප්‍රතිචක්‍රීකරණය හා අලුත් කිරීම)
7. නෛතික ( Legal ) සවිබලගැන්වීම
   පුද්ගලයින් හා සමාජයේ කොටස්කරුවන් වශයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් භුක්ති විදීමට ඇති අයිතිය ලබා දීම.
8. කාර්ය මණ්ඩල ( Employee) සවිබලගැන්වීම
   ඔවුන්ගේ ආයතනික ඉලක්ක පිළිබඳ තීරණ ගැනීමට යම් ප්‍රමාණයක නිදහස හා වගකීම හා වගවීම ලබා දීම.

5.2. සමෘද්ධි ව්‍යාපාරය, මතු පිටින් පෙනෙන දුප්පතුන්ට සහනාධාර ලබා දෙන සදාකාලිකව දුප්පතුන් දුප්පත්කමේ රඳවා තබා ගන්නා ව්‍යාපාරයක් නොවන අතර, එය ඉහතින් සඳහන් සියලුම ක්ෂේත්‍රයන් අන්තර්ගත ඒකාබද්ධ හා සමස්ත සවිබලගැන්වීම් ව්‍යාපාරයක් වන්නේය.

**6. සවිබල ගැන්වීමේ ක්‍රමෝපායන්**

ආර්ථික සවිබල ගැන්වීම ප්‍රධාන ක්‍රමෝපායන් 04 ක් යටතේ සිදු කෙරේ.

1. අධ්‍යාපනය ( Education )
2. සේවා නියුක්තිය ( Employment )
3. ව්‍යවසායකත්වය ( Entrepreneurship )
4. විනෝදාස්වාදය ( Entertainment ) මීට අමතරව,
5. කාර්ය මණ්ඩල ( Employee ) සවිබල ගැන්වීම

7. **සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වර්ගීකරණය**

7.1. සවිබලගැන්වීමේ පවුල් ඉලක්ක හඳුනා ගැනීමේ දි සමෘද්ධි පවුල් මූලික වශයෙන් වර්ග 04 කට වෙන් කෙරේ.

1. සවිබලගැන්වූ පවුල්
2. සවිබලගැන්විය නොහැකි පවුල්
3. සවිබලගැන්විය හැකි පවුල්
4. (i). සමෘද්ධි සහනාධාර ලැබිය යුතු එහෙත් සමෘද්ධි සහනාධාර නොලැබෙන පවුල්
   (ii). සහනාධාර නොමැති නිසා රු. 420/- ලබා දී ඇති, එහෙත් සහනාධාර ලැබිය යුතු පවුල්

7.1.1. **සවිබලගැන්වූ පවුල්** ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ.

(අ).තාවකාලිකව සවිබලගැන්වූ පවුල්

මූලික වශයෙන් ආර්ථික සවිබලගැන්වීම පදනම්ව එහෙත් සමාජීය හා මානසික වශයෙන් ද ඇතුළු අනෙකුත් සවිබලගැන්වීමේ ක්ෂේත්‍ර තුළින් යම්තාක් දුරට සාර්ථකත්වය ලැබූ පවුල් මෙයට අයත් වේ. මෙම පවුල් ක්‍රමානුකූලව සමස්තයක් ලෙස සවිබල ගන්වන තෙක් රු.420/- ක සහනාධාරයක් ඔවුන් වෙත ලබා දේ.

(ආ).පූර්ණ වශයෙන් සවිබලගැන්වූ පවුල්

මාසිකව ඉහළ ආදායමක් ලබමින් (උදා:- සමාජිකයින් 04 දෙනෙකු සිටින පවුලක මාසික ආදායම රු. 24,000/- හෝ ඊට වැඩි ආදායමක් උපයන), අනෙකුත් සවිබලගැන්වීම් ක්ෂේත්‍ර තුළින් ද, තිරසාරව සවිබල ගැන්වුන පවුල්, පූර්ණ ලෙස සවිබලගැන්වූ පවුල් ලෙස හැදින්වේ. මෙම පවුල්වලට තම කැමැත්ත පරිදි රු. 420/- හෝ සමාජ ආරක්ෂණ හා නිවාස ලොතැරැයි අරමුදලේ දායකත්වය වන රු. 150/- ගෙවා ( අනිවාර්ය ඉතුරුම් හැර ) වැඩසටහන තුළ රැදි සිටිය හැක.

7.1.2**. සවිබල ගැන්වීය නොහැකි පවුල් යනු,** කිසියම් හෝ ආර්ථික ක්‍රියාවලියක නිරතවිය නොහැකි රැකබලා ගත යුතු පවුල් වේ. එනම්, පැවිදි වූ, රෝගී වූ, වයස්ගත වූ, පූර්ණ වශයෙන් අබල දුබල වූ, මානසික හා ශාරීරික වශයෙන් දුර්වල වූ පවුල් මෙම ගණයට අයත් වේ.

7.1.3**. <u>සවිබල ගැන්වීය හැකි පවුල් යනු</u>,** විවිධ හේතූන් නිසා ආන්තීකරණයට හා අසාධාරණයට පත් වූ, එහෙත් සැබෑ ලෙසම සමස්තයක් ලෙස සෑම අතින්ම සවිබල ගැන්විය හැකි පවුල් වේ.

7.1.4. සමෘද්ධි සහනාධාර ලැබිය යුතු, එහෙත් දැනට සමෘද්ධි සහනාධාර නොලැබෙන පවුල් හා සහනාධාර නොමැති නිසා ප්‍රාදේශීය ලේකම් විසින් රු. 420/- ලබා දී ඇති, එහෙත් සහනාධාර ලැබිය යුතු පවුල් සැලකිය යුතු ප්‍රමාණයක් සිටින අතර, එම පවුල් ප්‍රමාණයන් නිශ්චිතව හඳුනාගත යුතු වේ.

ඒ අනුව, ඉහතින් සඳහන් කර ඇති සවිබල ගැන්වීමට ආදාල පවුල් වර්ග 4 දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, කලාප හා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් වෙන් වෙන්ව හඳුනාගත යුතු වේ. මෙම තොරතුරු ලබාගැනීමට අදාල ආකෘති පත්‍රය ඇමුණුම - I මඟින් ඉදිරිපත් කර ඇත.

**08.සවිබලගැන්වීමේ සැලැස්ම**

8.1. ඉහතින් සඳහන් කරන ලද සමස්ත සවිබලගැන්වීමේ ක්‍රියාවලිය ක්‍රියාවට නංවා, ඔවුන් සැබෑ ලෙසම දුගී බවෙන් මුදා ගැනීම සමෘද්ධි ව්‍යාපාරයේ ප්‍රමුඛතම අභිමතාර්ථය වන අතර, 2018 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභීන් අතුරින් සමෘද්ධි සහනාධාර ලබන මුළු පවුල් 1,388,242 න් දැනටමත් සවිබලගැන්වුන හා සවිබලගැන්විය නොහැකි පවුල් ප්‍රමාණය ඉවත් කල පසු, සැබෑ ලෙසම සවිබලගැන්විය හැකි සහනාධාරලාභී මුළු පවුල් ප්‍රමාණය 1,234,770 ක් වේ ( සමාජ සුබසාධන අංශය මඟින් 2017.12.31 දිනට ඉදිරිපත් කරන ලද උපරිම වාර්තාවේ තොරතුරුවලට අනුව ). මෙම පවුල් ප්‍රමාණයෙන් 10% ක්, එනම් පවුල් 125,000 ක් 2018 වර්ෂය තුළදී සවිබලගැන්වීමට අපේක්ෂා කරන අතර, ඊට අදාල සවිබල ගැන්වීමේ සැලැස්ම පිළිබඳව මේ වන විටත් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇත.

8.2. 2018 වර්ෂයේ පවුල් 125,000 ක් සවිබල ගැන්වීමේ සැලැස්ම සාරාංශ ගතව පහතින් දක්වා ඇත.

| | වැඩසටහන | සවිබල ගැන්වෙන පවුල් සංඛ්‍යාව | වෙන් කර ඇති ප්‍රතිපාදන (රු.මි. ) |
|---|---|---|---|
| 01. | ආර්ථික සවිබල ගැන්වීම | | |
| 1.1 | ආර්ථික හා ග්‍රාම සංවර්ධන වැඩසටහන | 30,578 | 930.00 |
| 1.2 | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 14,422 | 180.00 |
| 1.3 | ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන | 80,000 | බැංකු අරමුදල් |
| | **එකතුව** | **125,000** | **1,110.00** |
| 02. | සමාජ, සංස්කෘතික හා පාරිසරික සවිබල ගැන්වීම | වැඩසටහන් 5,336 | 340.00 |
| 03. | ශාරීරික සවිබල ගැන්වීම | වැඩසටහන් 1,431 | 30.00 |
| 04. | මානසික සවිබල ගැන්වීම | වැඩසටහන් 331 | 1.00 |
| 05. | නෛතික සවිබල ගැන්වීම | ප්‍රතිලාභීන් 4,100 | 1.33 |
| 06. | තීරණ ගැනීමට අදාල සවිබල ගැන්වීම | සංවිධාන 1,005 | 50.00 |
| 07. | කාර්ය මණ්ඩල සවිබල ගැන්වීම | සේවකයින් 25,657 | 89.70 |
| 08. | පොදු සංවර්ධන වැඩසටහන | වැඩසටහන් 07 | 377.97 |
| | **එකතුව** | | **2,000.00** |

ඉහත සවිබලගැන්වීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික්ක වශයෙන් පවුල් ඉලක්ක වෙන්කර ඇති ආකාරය ඇමුණුම - II මඟින් ඉදිරිපත් කර ඇති අතර, එක් එක් දිස්ත්‍රික්කය සඳහා වැය ශීර්ෂ 2509 යටතේ (සංවර්ධන වැය ශීර්ෂය යටතේ) ආශික වශයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති ආකාරය ඇමුණුම - III මඟින් ඉදිරිපත් කර ඇත.

8.3. ඉහත සඳහන් දිස්ත්‍රික් ඉලක්කයන් සපුරා ගැනීම සඳහා දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, කලාප කාර්යාල හා වසම් භාර නිලධාරීන් විසින් පහත සඳහන් සැලසුම් සකස් කල යුතු වේ.

- දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම - ( ඇමුණුම IV ආකෘතිය මඟින් ඉදිරිපත් කර ඇති පරිදි )

මෙම සැලැස්ම සකස් කිරීම දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් අධ්‍යක්ෂක හා ප්‍රජාමූල සංවිධානවල සමාජිකයින්ගේ දායකත්වයෙන් සිදු විය යුතු වේ.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සංවර්ධන සැලැස්ම ( ඇමුණුම V ආකෘතිය මඟින් ඉදිරිපත් කර ඇති පරිදි )
  මෙම සැලැස්ම සකස් කිරීම ප්‍රාදේශීය ලේකම්, මුලස්ථාන කළමණාකරු හා ප්‍රජාමූල සංවිධානවල සමාජිකයින්ගේ දායකත්වයෙන් සිදු විය යුතු වේ.
- කලාප මට්ටමේ සංවර්ධන සැලැස්ම ( ඇමුණුම VI ආකෘතිය මඟින් ඉදිරිපත් කර ඇති පරිදි) මෙම සැලැස්ම සකස් කිරීම මහා සංගම් කළමණාකරු, බැංකු කළමණාකරු හා ප්‍රජාමූල සංවිධානවල සමාජිකයින්ගේ දායකත්වයෙන් සිදු විය යුතු වේ.
  තවද, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංවර්ධන සැලැස්ම ක්ෂුද්‍රමූල්‍ය අංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ උපදෙස් පරිදි සකස් කල යුතු වේ.
- ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ සංවර්ධන සැලැස්ම ( ඇමුණුම VII ආකෘතිය මඟින් ඉදිරිපත් කර ඇති පරිදි )
  මෙම සැලැස්ම සකස් කිරීම සමෘද්ධි සංවර්ධන නිලධාරී හා ප්‍රජාමූල සංවිධානවල සමාජිකයින්ගේ දායකත්වයෙන් සිදු විය යුතු වේ.
- පවුල් සංවර්ධන සැලැස්ම
  මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ශද්‍ර අත විශ්ලේෂණය මගින්, ආදාල ප්‍රතිලාභී පවුලට සුදුසු ව්‍යාපෘතීන් හඳුනාගෙන එම එක් එක් පවුලට ආදාලව පවුල් සංවර්ධන සැලැස්මක් සකස් කල යුතු වේ. පවුල් සංවර්ධන සැලැස්ම සකස් කල යුතු ආකෘති පත්‍රය හා ඊට ආදාල උපදෙස් ඇතුලත්ව 2018.03.07 දින ආර්ථික සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශය මගින් නිකුත් කරන ලද 2018/03 ( ආර්ථික සවිබල ගැන්වීම ) චක්‍ර ලේඛයට කෙරෙහි අවධානය යොමු කරන ලෙස දන්වමි. මෙම චක්‍ර ලේඛයට අනුව, පවුල් ඒකක සවිබල ගැන්වීම සඳහා සකස් කරන ව්‍යාපෘති වාර්තාවෙහි අදාල පවුල් ඒකකය සවිබල ගැන්වීම සඳහා යෝජිත සියලුම ව්‍යාපෘතීන් අන්තර්ගත කර, වසමේ සවිබල ගැන්වීමේ පවුල් වලට අදාල සාරාංශ ගත වාර්තාවක් මේ සමඟ ඇති ඇමුණුම VIII අනුව සකස් කර ඉදිරිපත් කල යුතු වේ.

**09. සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තොරාගැනීම.**

9.1. සවිබලගැන්විය හැකි පවුල් ආදායම් මට්ටම අනුව ඉහල ආදායම් ලබන , මධ්‍යම ආදායම් ලබන හා පහළ ආදායම් ලබන වශයෙන් ආදායම් මට්ටම් 3කට බෙදා වෙන් කෙරේ. සවිබලගැන්වීමට අදාල ප්‍රතිලාභීන් අයත් ආදායම් කාණ්ඩය තිරණය කරනු ලබන්නේ, පවුලේ දැනට පවතින මාසික ආදායම හා පවුලේ සිටින සාමාජිකයින් සංඛ්‍යාව අනුවය. පවුලේ මාසික ආදායම හා සාමාජිකයින් සංඛ්‍යාව අනුව ආදායම් කාණ්ඩ ගත කර ඇති ආකාරය පහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

| පවුලේ සමාජිකයින් සංඛ්‍යාව | පවුලේ මාසික ආදායම ( රු. ) | ආදායම් කාණ්ඩය (රු. ) | | |
|---|---|---|---|---|
| | | ඉහළ ආදායම් කාණ්ඩය | මධ්‍යම ආදායම් කාණ්ඩය | පහළ ආදායම් කාණ්ඩය |
| 04 | 24,000.00 | 16,000.00 - 24,000.00 | 8,000.00 - 16,000.00 | 000.00 - 8,000.00 |
| 03 | 18,000.00 | 12,000.00 – 18.000.00 | 6,000.00 - 12,000.00 | 000.00- 6,000.00 |
| 02 | 12,000.00 | 8,000.00 - 12,000.00 | 4,000.00 - 8,000.00 | 000.00- 4,000.00 |
| 01 | 6,000.00 | 4,000.00 – 6,000.00 | 2,000.00 - 4,000.00 | 000.00- 2,000.00 |

9.2. සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය හා වසම් මට්ටමින් ප්‍රතිලාභීන් තොරා ගැනිමේ දි ඉහත වගුවේ හි සඳහන්, ඉහල ආදායම් කාණ්ඩය යටතේ ප්‍රතිලාභීන් තොරා ගත යුතු වන අතර, එම කාණ්ඩයේ සුදුසු ප්‍රතිලාභීන් නොමැතිනම් ඊලඟ ආදායම් කාණ්ඩය වන මධ්‍යම ආදායම් කාණ්ඩය යටතේ ප්‍රතිලාභින් තොරා ගැනීම සිදු කල යුතු වේ.

9.3. එක් එක් අංශ විසින් ඔවුන්ගේ සවිබලගැන්වීමේ වැඩසටහන් වලට ආදාල චක්‍ර ලේඛයන් ඉදිරියේ දි ඔබ වෙත නිකුත් කරන අතර, එම සියලුම අංශයන් යටතේ ක්‍රියාත්මක කරන සවිබලගැන්වීමේ වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දි ඉහතින් විස්තර කර ඇති පරිදි ඉහළ ආදායම් කාණ්ඩය හා මධ්‍යම ආදායම් කාණ්ඩය පදනම් කර ගත යුතු බව ද දැනුම් දෙමි.

**10. ප්‍රගතිය වාර්තා කිරීම**

10.1. ක්‍රියාත්මක කරනු ලබන සියලුම වැඩසටහන් පිළිබඳව දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමින් ප්‍රගති සමාලෝචනයන් සිදුකල යුතු වන අතර, ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂක හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී සහභාගී විය යුතු වේ.

10.2. සවිබල ගැන්වීමේ සැලැස්මේ සමස්ත දිස්ත්‍රික් ප්‍රගතිය දෙසතියකට වරක්, මසකට වරක් හා තෙයි මාසිකව ප්‍රධාන කාර්යාලයේ සැලසුම් හා මෙහෙයුම් අංශය වෙත වාර්තා කල යුතු වන අතර, එක් එක් අංශවලට අදාල ප්‍රගතිය වෙන් වෙන්ව එම අංශයන් වෙත ඉදිරිපත් කරන ලෙස ද දන්වමි.

10.3. මෙම වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවලට ආදාල තොරතුරු ඊ - සමෘද්ධි ව්‍යාපෘතියේ (e – Samurdhi Project) ඇති ව්‍යාපෘති හා වැඩසටහන් කළමනාකරණ මොඩියුලය (Project & Program Management Module) ට ඇතුලත් කිරීමටත්, ප්‍රගතිය නිසි පරිදි නියමිත දිනට යාවත්කාලීන කිරීමටත් ව්‍යාපෘති කළමනාකරු කටයුතු කල යුතු වේ. ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය නිසි පරිදි පුහුණු කර ගත යුතු වේ.

**11. අධීක්ෂණ හා පසු විපරම් කටයුතු**

11.1. දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනු ලබන සියලුම වැඩසටහන්වල දිස්ත්‍රික් අධීක්ෂණය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂක විසින් සිදුකල යුතු වේ. පසු විපරම් කටයුතු දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් හා විෂයන් භාර කළමණාකරුවන් විසින් නිරන්තරයෙන් සිදුකල යුතු වේ.

11.2. ප්‍රාදේශීය මට්ටමේ ප්‍රධාන අධීක්ෂණ නිලධාරීයා ප්‍රාදේශීය ලේකම් වන අතර, පසු විපරම් කිරීම මූලස්ථාන කළමණාකරු, ප්‍රජාමූල බැංකු සමිතියේ කළමණාකරු හා ව්‍යාපෘති කළමණාකරුගේ වගකීම වේ.

11.3.ප්‍රජාමූල බැංකු මට්ටමේ අධීක්ෂණය හා පසු විපරම් කටයුතු ප්‍රජාමූල බැංකු කළමණාකරුගේ වගකීම වේ.

11.4.වසම් මට්ටමේ අධීක්ෂණය හා පසු විපරම් කටයුතු වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී, බැංකු කළමණාකරු හා ක්ෂේත්‍ර සහයක විසින් සිදුකල යුතු වේ.

**12. ප්‍රජාමූල සංවිධාන සමාජ විගණකවරුන් ලෙස යොදා ගැනීම.**

ප්‍රජාව බලගැන්වීම සඳහා නව පනතින් හඳුන්වා දී ඇති ප්‍රජා මූල සංවිධාන, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් මට්ටමේ දී සමාජ විගණකයින් ලෙස යොදා ගත යුතු වේ. මීට ආදාල මගපෙන්වීම් හා උපදෙස් ඇතුලත් චක්‍ර ලේඛය ඉදිරියේ දී ප්‍රජාමූල සංවිධාන හා ක්‍රිඩා අංශය විසින් නිකුත් කරනු ඇත.

**13. කාර්ය සාධනය**

2018 වර්ෂයේ නිලධාරීන්ගේ කාර්ය සාධනය වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කර ඇති අතර, ඒ වෙනුවෙන් කාර්ය සාධන ඇගයිම් හා පර්යේෂණ නමින් නව අංශයක් ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කොට ඇති

අතර, එම අංශය යටතේ සේවකයින් වෙනුවෙන් නව කාර්ය සාධන හා ඇගයීම් ක්‍රමවේදයක් සකස් කරමින් පවතී. මේ යටතේ, සෑම නිලධාරියෙකු විසින් ම තමන්ට පැවරී ඇති රාජකාරී කටයුතු සාර්ථකව හා කාර්යක්ෂමව ඉටුකර ඇද්ද යන්න පිළිබඳව මැන බැලීමක් සිදුකරන අතර, ඉදිරියේ දී නිලධාරීන්ගේ කාර්ය සාධනය මත පදනම්ව සේවා ඇගයීම් සිදුකල යුතු වේ.

**14. පොදු කරුණු**

14.1. කාර්තු පදනම මත මුදල් වැය කිරීම හා ප්‍රගතිය මැනීම.
මේ සම්බන්ධව මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 263/2017 හා 2017.12.22 දිනැති චක්‍ර ලේඛයේ උපදෙස් පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

14.2. පරිපාලන වියදම්

සංවර්ධන ව්‍යාපෘති සඳහා දරනු ලබන රජයේ වියදමින් 2.5% ක් පරිපාලන වියදම් ලෙස වෙන් කල හැකි අතර, එක් එක් කාර්යාල සඳහා පරිපාලන වියදම් දැරීමේ ප්‍රතිශතයන් පහත පරිදි වේ.

- ❖ ප්‍රධාන කාර්යාලයේ පරිපාලන වියදම් සඳහා - 0.5%
- ❖ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන වියදම් සඳහා - 0.5%
- ❖ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන වියදම් සඳහා - 1.5%

14.3. විගණන කටයුතු

14.3.1. රාජ්‍ය විගණනය - ප්‍රතිපල හා නිමවුම් පාදක කර ගත් විගණනයක් සිදු කිරීම.
මේ සඳහා විගණකාධිපතිතුමා විසින් නිකුත් කර ඇති විලේ/විගණන/2017-05 හා 2017.03.31 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

14.3.2. 2018 වර්ෂය වෙනුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් ව ඇති හෙයින්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කර ඇති ප්‍රතිපාදන පිළිබඳව, දිස්ත්‍රික් විගණන නිලධාරීන් විසින් විගණනයක් සිදුකර, කාර්තුවකට වරක් වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වේ.

14.4. ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශයන් විසින් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ක්‍රියාකාරකම්වලට අදාල උපදෙස් හා මඟ පෙන්වීම් ඇතුලත් චක්‍ර ලේඛයන් එම අංශ විසින් වෙන වෙනම ඔබ වෙත නිකුත් කරන අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන ලෙස දැනුම් දෙමි.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව